ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கைச் சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Act No.13 of 1957
Reg.by Boy Scout International Bureau on -22.02.1953

**2022 අගෝස්තු මස 03** **චක්‍රලේඛ අංක 54/2022**

සියලුම දිසා කොමසාරිස්වරුන් වෙත,

<u>වාර්ෂික බාලදක්ෂ සංගණනය - 2022</u>

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය මගින් වාර්ෂිකව පවත්වනු ලබන බාලදක්ෂ සංගණනය හා තොරතුරු රැස්කිරීම, **2022** සැප්තැම්බර් **30** වන දිනට අදාල වන පරිදි දිවයින පුරා පැවැත්වීමට සංවිධානය කර ඇත.

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය, ලෝකයේ ජාතික බාලදක්ෂ සංගම් **172** ක් නියෝජනය කරමින් සාමාජිකයන් මිලියන **57** කින් සමන්විත ලෝක බාලදක්ෂ සංවිධානයේ සාමාජිකයෙකි. එනිසා සිඟිති,පෝතක ,බාලදක්ෂ හා මානවක බාලදක්ෂයින් හා නායකයින් ලෝක බාලදක්ෂ සංවිධානයේ ලියාපදිංචි කිරීම අපගේ යුතුකමක් වේ.

මේ සඳහා හඳුන්වා දෙන Excel පත්‍රිකා මේ සමග එවන අතර, ඒවා දිස්ත්‍රික්කයේ කණ්ඩායම් වෙත ලබා දිය යුතුවේ. කරුණාකර සංගණන කටයුතු භාරව දිස්ත්‍රික් සංවිධායකවරයෙකු පත් කොට ඔහුගේ/ඇයගේ නම, බාලදක්ෂ තනතුර, දුරකථන අංකය හා email ආදී තොරතුරු, **2022** අගෝස්තු මස **15** වන දිනට පෙර ජාතික බාලදක්ෂ මූලස්ථානයට එවන ලෙස කාරුණිකව දන්වමු.

සියලුම අංශ වල නායක මහත්ම මහත්මීන් විසින් තම සමූහයේ තමන් නායකත්වය දරණ ඒකක වල සාමාජිකයින් (එනම් සිඟිති,පෝතක,බාලදක්ෂ,මානවක) පිළිබඳ නිවැරදි තොරතුරු ආශ්‍රයෙන් එම පෝරම සම්පූර්ණ කර, සමූහ බාලදක්ෂ නායක/විදුහල්පති තුමාගේ අනුමැතිය ඇතිව, සාමාජික මුදල් ද සමග, (අනුමත සාමාජික මුදල පහත දක්වා ඇත.) **2022** ඔක්තෝම්බර් මස **15** දිනට පෙර දිස්ත්‍රික් සංවිධායක තුමා මගින් දිස්ත්‍රික් කොමසාරිස්වරුන් වෙත යොමු කළ යුතු වේ.

සියළුම සංගණන පෝරම හා විස්තර දිස්ත්‍රික් සංවිධායක තුමා විසින් දිස්ත්‍රික් කොමසාරිස් තුමාගේ අනුමැතිය සහිතව සාමාජික මුදල් ගෙවූ තොරතුරු සමග **2022** ඔක්තෝම්බර් මස **31** දිනට පෙර ජාතික බාලදක්ෂ මූලස්ථානය වෙත එවිය යුතු වේ. මෙසේ භාර දීමෙන් පසු ජාතික බාලදක්ෂ මූලස්ථානය විසින් රිසිට්පතක් නිකුත් කෙරේ. මෙසේ පෝරම හා මුදල් ගෙවා සම්පූර්ණ කරන ලද දිස්ත්‍රික්ක වලට පමණක් **2023** සංගණන පදක්කම් නිකුත් කරනු ලැබේ.

- ඇමුණුම A - දිසාවේ බාලදක්ෂ කණ්ඩායම් මෙම පෝරමය පුරවා දිසා කොමසාරිස්තුමා වෙත යැවිය යුතුය.
- ඇමුණුම B - මෙම පෝරමය , සංගණන භාර දිස්ත්‍රික් සම්බන්ධීකාරක විසින් පුරවා, දිසා කොමසාරිස්තුමා මගින් ජාතික බාලදක්ෂ මූලස්ථානය වෙත එවිය යුතුය.

සංගණන මුදල් පහත බැංකු ගැණුමට බැර කළ යුතුය.

Commercial Bank, City Branch
Sri Lanka Scout Association Colombo District Branch
Acc/No.1503974601,

65/9 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,කොළඹ 02, ශ්‍රී ලංකා
சர். சிற்றம்பலம் ஏ. கார்டினர் மாவத்தை,கொழும்பு 02. இலங்கை.
Sir Chittampalam A Gardiner Mawatha,Colombo 02,Sri Lanka
Tel : +94 11 2 433 131/+94 11 5 231512
Fax : +94 11 2 433 131
E-mail: slsaheadq@gmail.com
Web : www.scout.lk

මුදල් ගෙවීමෙන් පසු තැන්පතු පත්‍රිකාව 0777 580 646 අංකයට **WhatsApp** කරන ලෙස දන්වා සිටින අතර, මුදල් තැන්පත් කරන්නාගේ නම, දිනය, දිස්ත්‍රික්කය, තැන්පත් කරන මුදල් ප්‍රමාණය, මුදල් ගෙවනු ලබන සාමාජිකයින් ගණන හා **"2022 සංසණන"** ලෙස රිසිට්පතේ පිටුපස සදහන් කර **WhatsApp** කරන ලෙස කාරුණිකව දන්වා සිටිමු. **ATM** මැෂින් හරහා මුදල් තැන්පත් කිරිම මගින් අනන්‍යතාවය තහවුරු කර ගත නොහැකි වන බැවින් එසේ මුදල් තැන්පත් කිරීමෙන් වළකින ලෙස වැඩිදුරටත් දන්වා සිටිමු.

<u>වාර්ෂික සංගණන ගාස්තු</u>

**2022** වසර සඳහා සංගණන ගාස්තුව රු. **50.00** කි.

| | |
|---|---|
| සිඟිති, පෝතක,බාලදක්ෂ හා මානවකයින්<br>බාලදක්ෂ නායකයින්, කොමසාරිස්වරුන් හා ගිහි සාමාජිකයින් සඳහා | රු. 50.00 |

මෙම සංගණන දත්ත පරිගණකගත කිරීමට අපේක්ෂා කරන හෙයින් නිවැරදි තොරතුරු ආශ්‍රයෙන් පෝරම සම්පූර්ණ කිරීමට උපදෙස් ලබා දෙන මෙන් ඔබ සැමගෙන් කාරුණිකව ඉල්ලා සිටුමු.

**2022** සංගණන සම්බන්ධ සියළු තොරතුරු හා Excel පත්‍රිකා slsa.census@gmail.com යන විද්‍යුත් ලිපියනට එවන මෙන් දන්වමු.

මේ සඳහා දිස්ත්‍රික් සංවිධායකවරුන්ගේත් දිස්ත්‍රික් කොමසාරිස්වරුන්ගෙත් පූර්ණ සහයෝගය අපේක්ෂා කරමු.

ස්තූතියි.

මෙයට,
බාලදක්ෂ සේවයේ නියුතු,

වෛද්‍ය මංජුල සහබන්දු
සහාය ප්‍රධාන කොමසාරිස්(පරිපාලන)

ජනප්‍රිත් ප්‍රනාන්දු
ප්‍රධාන කොමසාරිස්

| | | |
|---|---|---|
| පිටපත් - | සභාපති, විධායක කමිටු සභාපති, ගරු ලේකම්, ගරු භාණ්ඩාගාරික<br>මූලස්ථානයේ සියුළුම කොමසාරිස්වරුන් වෙත | කා. දැ. පි. |